www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# 2009 වසරේදී, ලොව පුරා සාගින්නෙන් පෙලෙන ජනතාවගේ සංඛ්‍යාව බිලියනය ඉක්මවනු ඇත

## More than 1 billion people hungry worldwide in 2009

**ජෝ කිශෝර් විසිනි**

**2009 ජූනි 20**

මේ වසර තුල මානව සංහතිය ඉතිහාසයේ පලමුවතාවට අත්පත් කර ගනු ඇත්තේ සිය සාමාජිකයන්ගෙන් බිලියනයකට අධික සංඛ්‍යාවක් සාගින්නෙන් පෙලෙන තත්ත්වයක සැක කටයුතු අපූර්වත්වයයි.

එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයට (එෆ්ඒඕ) අනුව, මන්දපෝෂනයෙන් පෙලෙන සංඛ්‍යාව පසුගිය වසරට වඩා මිලියන 100කින් ඉහල නැග, බිලියන 1.02ක් වනු ඇතැයි ගනන් බලා ඇත.

ලොව සාගින්නෙන් පෙලෙන්නන් සියයට 11 කින් වේගයෙන් ඉහල නැගීම වූ කලි ප්‍රධාන කොටම, අඛන්ඩව ඉහල නගින ආහාර මිල ගනන් හා සංයෝජනය වූ ගෝලීය ආර්ථික අර්බුදයෙහි නිමැවුමකි. මේ වසරෙහි දී, ලෝක ආර්ථික නිමැවුම සියයට 3කට වඩා පිරිහී යනු ඇතැයි අපේක්ෂා කෙරේ - මෙය දෙවෙනි ලෝක සංග්‍රාමයෙන් අනතුරුව ඇති වූ පලමුවැනි ගෝලීය හැකිලීමයි. ''ආර්ථික අර්බුදය දුප්පතුන්ගේ ආදායම් හා රැකියා අවස්ථා අඩු කර ඇති අතර ඔවුන්ගේ ආහාර ලබාගැනීමේ හැකියාව කැපීපෙනෙන ලෙස පහත දමා ඇතැයි'' එෆ්ඒඕ සංවිධානය සටහන් කරයි.

ලොව සාගින්නෙන් පෙලෙන අය කේන්ද්‍රගතවී සිටින්නේ ආසියාව හා පැසිෆික් කලාපය (මිලියන 642), උප සහරානු අප්‍රිකාව (මිලියන 265), ලතින් ඇමරිකාව හා කැරීබියානු ප්‍රදේශ (මිලියන 53), නුදුරු නැගෙනහිර හා උතුරු ඇමරිකාව (මිලියන 42) තුල ය. සාගින්නෙන් පෙලෙන්නන්ගේ ඉහල ම කේන්ද්‍රගතවීම ඇත්තේ උප සහරානු අප්‍රිකාවෙහි වන අතර එය වේගවත් ලෙස වර්ධනය වී ඇත්තේ මැද පෙරදිගෙහි හා උතුරු අප්‍රිකාවෙහි ය.

සාගින්නෙන් පෙලෙන අය පිලිබඳ එෆ්ඒඕ සංවිධානයෙහි නිර්වචනය පදනම් වී ඇත්තේ පරිභෝජනය කරන කැලරි ප්‍රමානය මතය. යම් කිසි රටක සාපේක්ෂ වයස් හා ලිංගික වර්ගීකරන අනුපාත මත සාගින්නෙන් පෙලෙන අය අන් අයගෙන් වෙන් කෙරෙන්නේ දිනකට කැලරි 1,600-2,000 අතර ප්‍රමානයකිනි.

එෆ්ඒඕ සංවිධානයෙහි සංඛ්‍යා සාගින්නෙන් පෙලෙන අයගේ සංඛ්‍යාව බොහෝ සෙයින් අවතක්සේරු කරනවා විය හැක. එක්සත් ජනපදයෙහි ප්‍රමානවත් නොවන ආහාර පරිභෝජනය කිරීමේ අවදානමට ලක්වූ ළමුන් මිලියන 12ක් සිටින බව මේ වසර මුල දී පලකරන ලද අධ්‍යයනයකින් අනාවරනය විය. (බලන්නඃ ''එක්සත් ජනපදයඃ ළමුන් මිලියන 12ක් සාගින්නට හා ආහාර අනාරක්ෂිත බවට මුහුන දෙයි.) සමස්ත ''සංවර්ධිත ලෝකයේ'' (එක්සත් ජනපදය හා යුරෝපය ද ඇතුලුව) සාගින්නෙන් පෙලෙන මිනිසුන්ගේ සංඛ්‍යාව මිලියන 15කැයි එෆ්ඒඕ සංවිධානය ඇස්තමේන්තු කරයි.

එෆ්ඒඕ සංවිධානයට අනුව, සාගින්න වර්ධනයවීම ආහාර නිෂ්පාදනය පිරිහීමෙහි ප්‍රතිඵලයක් නොවේ. නිදසුනක් වශයෙන්, 2008 වසරට සාපේක්ෂව මේ වසරෙහි ධාන්‍ය නිෂ්පාදනය අඩුවන්නේ සුලු ප්‍රමානයකින් පමනි. ඒ වෙනුවට, ''විශේෂයෙන් දේශීය වශයෙන් මිලගනන් තවමත් අනම්‍ය ලෙස පවතින රටවල වෙලෙඳපොලවල දී ආහාර මිලයට ගැනීමට දුප්පතුන්ට ඇති හැකියාව අඩුවේ.... 2008 වසර අවසන දී, දේශීයව පරිභෝජනයට ගන්නා ප්‍රධාන ආහාරවල මිල ගනන්වල සාමාන්‍යය මූර්ත අගය අනුව ඊට දෙවසරකට කලින් තිබූ මිල ගනන්වලට වඩා තවත් සියයට 24කින් වැඩිවිය. මේ නිගමනය අත්‍යවශ්‍ය ආහාර වර්ග පරාසයකට ම පොදු වේ.''

කෘෂිකාර්මික සම්පත් තාර්කනිකව හා විද්‍යාත්මකව යොදා ගැනීමෙන් ගෝලීය ආහාර නිෂ්පාදනය සැලකිය යුතු ලෙස වර්ධනය කල හැකි වුව ද වෙනත් වචනවලින් කිව හොත් සාගින්න තියුනු ලෙසින් වර්ධනය වීමෙහි හේතුව, ශක්‍යතාවය හීනවී යාම නොවේ. ඒ වෙනුවට සමාජ දරිද්‍රතාවය වැඩී යන්නේ අමතරව මිලියන ගනන් ජනතාවකට තමන්ගේ අති මූලික අවශ්‍යතාවන් පවා ඉටු කර ගැනීමේ ශක්තිය නොමැති වීමේ හේතුවෙනි.

වර්තමාන අර්බුදය විශේෂයෙන් තීව්‍ර කරන අංග තුනක් එෆ්ඒඕ සංවිධානය මතු කර පෙන්වයි. පලමුව, වර්තමාන අර්බුදය, 2006-07 ආහාර මිල වේගයෙන් ඉහල යාම පසුපසින් ගමන් ගනියි. අධ වශයෙන් මෙම බුබුලේ ක්‍රියාකාරිත්වයට හේතු වූයේ මූල්‍ය අර්බුදය වර්ධනය වත්ම වෙලඳ භාන්ඩවලට මුදල් විශාල ලෙස යෙදවීමේ ආයෝජකයන්ගේ සමපේක්ෂන ක්‍රියාවලියක් මගින් ය. කලින් කියන ලද වේගයෙන් මිල ඉහල නැගීමේ මෙම සංසිද්ධිය ආර්ථික කම්පනයන්ට මුහුන පෑම සඳහා කුටුම්භයන් විසින් නිර්මානය කරන ලද කුමන හෝ අවරෝධකයන් බාදනය කර දැමීය.

දෙවනුව, මේ අර්බුදය ගෝලීය ස්වභාවයක් ගෙන තිබීමයි. ''ආර්ථික අර්බුදය තනි රටවලට හෝ එක්තරා කලාපයක රටවල් කිහිපයකට සීමා වී තිබිය දී එහි ප්‍රතිවිපාකයන්ට මුහුන දීම සඳහා මුදලේ අවප්‍රමානය, නය ගැනීම හෝ වැඩිවැඩියෙන් නිල ආධාර සැපයීම වැනි මෙවලම්වල පිහිට පැතීමට ආන්ඩුවලට හැකියාව තිබුනේ'' යයි එෆ්ඒඕ සංවිධානය සටහන් කරයි.

තෙවැනිව, දුප්පත් රටවල් ''මූල්‍යමය හා වානිජමය වශයෙන් ලෝක ආර්ථිකය තුලට වැඩිපුරම එකාග්‍රවී තිබීම යි.'' එමනිසා, ''එම රටවල් ජාත්‍යන්තර වෙලඳපොලවල වෙනස්වීම්වලට වඩාත් විවෘතව ඇත.'' ගෝලීය ඉල්ලුමෙහි හෝ සැපයුමේ හා නය සීමාවන්හි වේගවත් වෙනස්වීම්වලට එම රටවල් බොහෝ සෙයින් ගොදුරු වේ.

එෆ්ඒඕ සංවිධානය විසින් සඳහන් නොකරන ලද මීට සම්බන්ධ තවත් කරුනක් නම් බැංකුවලට ඇපදීම සඳහා ඩොලර් ට්‍රිලියන ගනනින් මුදල් යෙදවීමට අරමුදල් සැපයීම සඳහා මුදල් වෙලඳපොලවල තනි බලය එක්සත් ජනපද ආන්ඩුව තමන් සතු කර ගත් ආකාරයයි. එසේ කරන ලද්දේ ඇමරිකානු ඩොලරයෙහි වරප්‍රසාදිත තත්ත්වය ප්‍රයෝජනයට ගනිමිනි. වඩා දුප්පත් රටවලට මේ වරප්‍රසාදය නැත. එහි ප්‍රතිඵලයක් වශයෙන් එම රටවලට නය ගැනීමේ දී වඩාත් වැඩි පිරිවැයක් දැරීමට සිදුව තිබේ.

''සංවර්ධනය වන රටවලට'' ලබාදෙන නය සඳහා පොලී අනුපාතික ඉහල දැමීම සමග ඇතැම් රටවලට පූර්න නය පහසුකම් නොලැබීයාම වෙත ද එෆ්ඒඕ සංවිධානය අවධානය යොමු කරයි. ආර්ථික අර්බුදය, සෘජු විදේශ ආයෝජන වියැකීයෑම ද ඇතුලු, ප්‍රාග්ධන වෙලඳපොලවල වේගවත් මාරුවීම්වලට මං පාදා ඇත.

විදේශයන්හි රැකියාවල නියුතු - අය විසින් එවන මුදල් බොහෝවිට එසේ එවන මුදල් ඒවා ලබන රටවල සියයට 5 සිට 8ක් දක්වා තියුනු ලෙස පහත වැටීමේ තත්ත්වයකට - වඩා දුප්පත් බොහොමයක් මුහුන පා සිටියි. තවද, එසේ ලැබෙන විදේශ මුදල් සාමාන්‍යයෙන් කම්පනයන්ට ඔරොත්තු දෙන අතර ආර්ථික අර්බුදය පැන නැගි අවස්ථාවල වැඩි වීමක් පවා සිදුවේ. වර්තමාන පසුබෑමෙහි ගෝලීය පරිමාන ස්වභාවය හේතු කොට ගෙන මේ මාරු වීම්වල ඉහත ප්‍රතිචක්‍රීය ප්‍රතිඵල මෙවර ඇතිවිය නොහැක්කකැ''යි එෆ්ඒඕ සංවිධානය සටහන් කරයි.

දුප්පත්ම රටවල් 71කට ලබා දෙන විදේශ ආධාර සියයට 25කින් පහත වැටෙනු ඇතැයි ද එෆ්ඒඕ සංවිධානය අනාවැකි පල කරයි. එක්සත් ජනපදයෙහි බැංකුවලට ඇපදීම සඳහා ඩොලර් ට්‍රිලියන් ගනනින් මුදල් යෙදවීමට හා එක්සත් ජනපද හමුදා අයවැය සඳහා ඩොලර් බිලියන 500කට අධික මුදලක් වෙන් කිරීමට සාපේක්ෂව සියලුම රටවලින් ලබාදෙන නිල සංවර්ධන ආධාර (ඕඩීඒ) වල මුලු ප්‍රමානය වසරකට ඩොලර් බිලියන 100ක් පමනක් විය.

ආර්ථික අර්බුදය හේතු කොට ගෙන විශේෂයෙන් ම පහර වැදී ඇත්තේ නිර්යාත මත යැපෙන රටවලට ය. මේ වසරේ දී ලෝක වෙලඳම සියයට 5 සියයට 9 කින් පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. ගෝලීය ආර්ථිකය වේගයෙන් පිරිහී යාමේ ගම්‍යයන් හා ඒ හේතු කොට ගෙන දස ලක්ෂ සංඛ්‍යාත ජනයාගේ ජීවන තත්ත්වයන් පිරිහීම පිලිබඳව එක්සත් ජාතීන්ගේ නිලධාරීහු හොඳින් අවබෝධ කර ගෙන සිටිති. ''නිහඬ සාගිනි අර්බුදය... ලෝක සාමයට හා සුරක්ෂිතතාවයට බරපතල අවදානමක් එල්ල කරයි'' යයි එෆ්ඒඕ සංවිධානයෙහි අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ජාක්ස් ඩියුෆ් ප්‍රකාශ කලේ ය. ''සාගින්නෙන් පෙලෙන ලොවක් යනු අන්තරායකාරී ලොවකැ''යි ලෝක ආහාර වැඩපිළිවෙලෙහි ජොසට් ශිරාන් ප්‍රකාශ කලේ ය.

ආහාර මුල් කොට ගෙන 2008 වසරේදී ඇතිවුනු කැරලි යලි ඇතිවීමේ හැකියාව ගැන බොහෝ විචාරකයෝ අවධානය යොමු කලහ. ගෝලීය මට්ටමේ ''ආහාර පිලිබඳ හදිසි අවස්ථාව'' සාකච්ඡාවට බඳුන් කිරීම සඳහා රටවල් 8හි කන්ඩායම මේ වසර මුල දී රැස්විනි. සමාජ කැලඹීම හා විප්ලවය පිලිබඳ පොදුවේ ප්‍රකාශිත සැලකිල්ල හැරුනු විට එම සම්මේලනයෙන් වැඩි යමක් ඉස්මතු වූයේ නැත.